# සොකරි



# සොකරි කතා පුවත

- කසි රටේ ගුරු හාමි නම් තැනැත්තකු සොකරි නැමති රූමත් ස්ත්‍රියක් සරණ පාවා ගනී. ගුරුහාමි තම රූමත් බිරිය වන සොකරි සහ කාලි අම්මාත් පරයාත් සමග දරුවෙකු අපේක්ෂාවෙන් පත්තිනි දේවියට භාර වීම සදහා ලංකාවට පැමිනේ. ඔවුන් ලංකාවට පැමිණ තඹරාවිට නම් ගමේ පදිංචි වේ. දිනක් වතුර ගෙන ඒමට වෙදරාළගේ ගෙදරට යන ගුරු හාමිගේ කකුලේ වෙදරාළගේ බල්ලා සපා කයි. වෙදරාළ ගුරුහාමිට බෙහෙත් කරනුයේ සොකරිය පිළිබදව කැදරකමිනි. ලෙඩේ සුවවන අතර වෙදරාළ සමග සොකරිය රහසේ පලා යයි. කතරගම දෙවියන්ට භාරවීමෙන් අනතුරුව සොකරිය සොයා ගනී. කථාව අවසන් වන්නේ වෙදරාළටදාව සොකරිය විසින් දරුවෙකු බිහි කිරීමෙන් අනතුරුවය.

# පැවැත්වීමේ අරමුණු

- සශ්‍රීකත්වය
- විනෝදාස්වාදය
- මානව පැවැත්ම

# සොකරි

උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාටකයකි

<u>**ප්‍රචලිත ප්‍රදේශ**</u>

හඟුරන්කෙත

බදුල්ල (දවුල )

වන්නිය (උඩැක්කිය )

කළුන්දෑව

කොණකගල

මාතලේ

# fidlrs rÕuy

## සොකරි රංගමඩල



# සොකරි චරිත







මෙම කතාවේ සකස් කරන ලද විවිධ වෙස් මුහුණු භාවිතා කර ඇත . නමුත් පැරණි කාලයේ කොළපත් වෙස් මුහුණු භාවිතා කර ඇත .

# සොකරි

- මෙම චරිතය නිරූපනය කරනු ලබන්නේ පිරිමි පුත්ගලයකු විසිණි. උඩරට ඔසරියකින් හා මාල වළලු පළදින මොහු බොරු කොණ්ඩයකින් සැරසී සිටී .මෙම චරිතය පිරිමින් වසඟයට ගන්නා අයුරින් ශෘංගාරාත්මක ලෙස නිරූපනය කර ඇත.සොකරියගේ අතෙහි මල් මිටක් ද ඇතැම් පළාත්වල ලේන්සුවක් ද දක්නට ඇත.රංගනය සඳහා (දොංජිජිගත )බෙරපදය වාදනය කරයි.

සොකරිය එන්නේ සබයෙන් අවසර ගන්නේ

නැටුම් නටන්නේ තාලෙට රාග කියන්නේ

පද අල්ලන්නී පියයුරැ ලැම සොලවන්නේ

කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නේ

# ගුරුගෝමි

- ගුරුගෝමි හෙවත් ආඪ්‍ය ගුරු කැඩිච්ච සිංහලෙන් අමාරුවෙන් කතා කරන අයෙකි ඔහු උඩරට වෙස් නැට්ටුවෙකු ඇඳුම ඇසුරින් නිර්මාණය කරගත් ඇඳුමින් සැරසී ඇත පපු ප්‍රදේශයේ මෙන්ම නළලේද සුදු පාටින් ඉරිඇද ඇත.

# සොත්තානා

- වෙදරාළුගේ පුතා ලෙස සලකනු ලබයි. කුඩා දරුවෙකු ලෙස කොට කළිසමකින් හා බැනියමක් අන්දවා කොළපත් වෙස් මුහුණක් පැළද ඇත. මෙහි සියළුම චරිත දොංපිපිගත යන බෙර පදය අනුව නර්තනය කරයි.

# පරයා

- පරයා යනු විකට චරිතයකි කොළපතකින් සකසන ලද වෙස් මුහුණක් පැළද සිටී. සොකරියගේ අතවැසියා වේ ප්‍රේක්ෂකයාට හාස්‍ය රසය ලබා දෙයි.

# පැවරුම

- 1) සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
- 2) එම නාටකයට විශේෂ වූ කරුණු තුනක් නම් කරන්න .
- 3) එහි ඇතුලත් චරිත තුනක් නම් කරන්න .
- 4) එම නාටකයට අදාල කවියක් ලියන්න.